දරුවන් විසපන් දහසකට අධික ප්‍රමාණයක් ජීවත් වන බන වාර්තා වෙයි. ජාතික වශයෙන් ඇති මෙම සෝ පාළුව සිංහල සංක්‍රමික විශ්ව සංගණනයකින් විමසා බැලිය යුත්තකි. රටට අපගේ ජාතිය සංඛ්‍යාත්මකව අහිමි වීම මෙන්ම, විදේශවලදී අපගේ අනන්‍යතාවයන් දියවී වයාමද නොවැළැක්විය හැක්කකි. විදේශ රටවල ජීවත් වන විදේශ සංක්‍රමිකයන් ඡන්ද බලයක් හෝ නොමැති පුරවැසියන් වන අතර, ඔවුන්ගේ දූදරුවන් විශේෂයෙන්ම උපතින්ම ඒ ඒ රටේ ජාතිකයෙකු බවට පත්ව අනාගත පරම්පරාවට හිමිවන ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳව ගැටළු මතුවිය හැක, විදේශ රටකදී සිංහල භාෂාව හා සංස්කෘතිය හා ස්වකීය ආගමෙහි සුරක්ෂිතතාවයේ ප්‍රවර්ධනය සඳහා රජය සමඟ බැඳුනු ස්ථිරසාර සංවර්ධනය වැඩ පිළිවෙලක් පිළිබඳව ජ්‍යේෂ්ඨ පුරවැසියන් හා අවධානය යොමු විය යුත්තකි. එවන් අවස්ථාවක් ලෙස පළමු ශා. ඩිල්බන්ස් සිංහල භාෂා පාසලෙහි වසර අවසාන ප්‍රසංග වාර්තාව කියවා අමන්දානන්දයට පත්වූයෙමි.

ජාතියක ජීවනාලය බොහෝ දුරට ස්ථාපිත වන්නේ මව් බස හා ආගම යන උරුමයන් පදනම් කොටගෙන බව පිළිගැනේ. යටත් විජිත ජාතීන් රටවල් යටත් කරගැනීමේදී යොදාගත් ප්‍රධාන පරිපාලන සාදක වූයේද ඒවාය. භාෂාව යනු ජාතික සංස්කෘතියේ පදනම වේ. සංක්‍රමිකයන් මට අභියෝග වන්නේද මෙම උරුමයන් ආරක්ෂා කරගැනීමය. මෙම අවශ්‍යතාව හා වටිනාකම තේරුම් ගෙන ඇති ඕස්ට්‍රේලියානු රජය මෙරට ජීවත්වන සෑම ජාතියකම මව් බසේ වර්ධනය සඳහා පුළුල් වැඩපිළිවෙලක් සකස් කර තිබීම පැසසිය යුත්තකි. මා මීට පෙරද ප්‍රශංසාවට ලක් කළ පරිදි මෙරටට විවිධ ප්‍රජා සංවිධාන මගින් ප්‍රකාශයට පත්කර නොමිලේ බෙදා හරින සඟරා, ප්‍රකාශන මගින් ඉටුවන ශාස්ත්‍රීය සේවාවද ආශීර්වාදයකි. මෙරට ව්‍යාප්තව ඇති බෞද්ධ පන්සල් මගින් ඉටුවන සංස්කෘතික ප්‍රබෝධයද සංක්‍රමිකයනට අමා වැස්සකි. මෙහිදී අවධානය යොමු විය යුතු ප්‍රධාන කරුණක් වන්නේ ..... පරපුර කෙතරම් දුරට මෙම සම්පත් අවස්ථාවලින් තමා සහ තම දෙවන පරපුර පොහොසත් කිරීමට පෙළඹී ඇත්දැයි විමසා බැලීමය. සිංහල බස භාවිත වන්නේ ශ්‍රී ලංකාව තුල පමණකි. එහි ප්‍රවර්ධනය පවතින්නේ ද සිංහලයන් අතර පමණකි. අප ඒ බස හා ඒ උරුමයන් රැක ගන්නා තාක් කල් සිංහල කම හා බෞද්ධ කම රැකෙනු ඇත. මෙහි ජීවත් වන සිංහල දරුවන් මෙන්ම උපතින්ම ඕස්ට්‍රේලියන් වන සිංහල දරුවන් තුල සිංහලකම ස්ථාපිත කිරීමට වෙනම පුළුල් වැඩපිළිවෙලක් තිබිය යුතුය. මන්ද වැඩිහිටියන්ගේ නොසැලකිල්ල නිසා සිංහල බසින් ඈත් වූ දරුවන් එ ලැජ්ජාව නිසාම ශ්‍රී ලංකාවට යාමට පවා නොකැමති තත්තවයක් උදා වී ඇති අවස්ථා පවා අපට වාර්තා වී ඇති බැවිනි. දැනට රජය මගින් ආරම්භ කර ඇති සිංහල සති අන්ත පාසලකටවත් ඇතුලත් නොකළහොත්; බොහෝ දෙමව්පියන් කරන ගෙදරදී පමණක් සිංහල භාවිකා කිරීමෙන් සිංහල කම පවත්වා ගත නොහැකි වනු ඇත.



ශ්‍රී ලාංකික සිංහල ප්‍රජාව මෙරට තුළ මව් බස සුරැකීමේදී වැඩිහිටි පරම්පරාව රැස්වන සෑම අවස්ථාවකම සිංහලෙන් පමණක් අදහස් හුවමාරු කරගැනීම දරුවන්ට ලබාදිය හැකි මාහැඟි ආදර්ශයකි. එදේස දිංහල පුවත් පත් සඟරා පොත පත නිවස තුළ නිතර භාවිතය හා මාධ්‍ය හරහා සිංහල වැඩසටහන් නැරඹීමට සැලැස්වීමද අත්‍යාවශ්‍ය වේ. සිංහල භාෂා සාහිත්‍යයේ ආස්වාදය ලබාගන්නා දරුවන් පිණිබර වූ මල් මෙන් පිබිදෙන ආකාරය සිංහල පන්තිවල ඉගැන්වීමේදී විඳ දරා ඇත්තෙමි. ඒ ඒ වයස්වල දරුවන්ට යෝග්‍ය වන පරිදි සාහිත්‍ය අනුබලය ලබාදීම ඔවුන් ප්‍රබෝධ කළ හැකි මාය්‍යකි. මේ ලිපි පෙළින් ඒ සඳහා උපකාරක ප්‍රවේශයක් ලබා දීම අපගේ වෑයම වන්නේය. "සම්භාව්‍ය කතන්දර කලාව" යන ලිපියෙන් කතන්දර සාහිත්‍යයේ වටිනාකම අප විමසා බැලුවෙමු. "ළමයින්ගේ ලෝකය සොයා යාම" ලිපියෙන් භෘෂා සාහිත්‍යය කුසලතා පෙරදැරි කරගෙන වයස් කාණ්ඩ හතරක් ඔස්සේ ළමා වර්ගීකරණයකට අප යොමු වූයේ ඒ ඒ වයස් කාණ්ඩවලට සුදුසු භාෂා සාහිත්‍යය හඳුනා ගැනීම සඳහාය.

ළමයා යනුවෙන් හැඳින්වෙන්නේ උපතේ සිට වයස අවුරුදු 05 දක්වාද, අවුරුදු 05 සිට 07 දක්වාද වයස අවුරුදු 07 සිට 11 දක්වාද වයස 11 සිට 14 දක්වා විධිමත් චින්තන අවධිය ලෙස සැලකෙන කාණ්ඩ 04කින් යුත් ළමා අවදියටය. පාසල් අධ්‍යාපනයට ළමයා යොමුවන වයස අවුරුදු 05ට උදාවන විට ඔවුන්ගේ ලෝකයට සංස්කෘතියට හුරු කළ යුතු බව මනෝ විද්‍යා මතය වේ. ළමා ලෝකයේ සියළු සුන්දරත්වය මේ වයසේ දී ලබා දිය යුතුය. ඉන් පසු වසය අවුරුදු 15 සිට උදාවන නව යොවුන් විය ළමයා ශාරීරික හා මානසික වශයෙන් පරිවර්තනයකට පත් කරවන්නක් හෙයිනි. මෙම ළමා ලෝකය විසින් හා සාහිත්‍යයෙන් චමත්කාර කිරීමට පෙළගැසුනු අපූර්ව සාහිත්‍ය නිර්මාණවලින් හා සාහිත්‍යයෙන් චමත්කාර කිරීමට පෙළ ගැසුණු පූර්ව සාහිත්‍යය නිර්මාණවලින් ශ්‍රී ලංකාව පොහොසත්ය. කුමාරතුංග මුණිදාස, ටී. බී. ඉලංගරත්න, මාර්ටින් වික්‍රමසිංහ, ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි, සිබිල් වෙත්තසිංහ වැනි ප්‍රකට නිර්මාණ කරුවන් හා ඔවුන්ගේ නිර්මාණ මෙරට ළමා පරපුරෙහි චමත්කාරය සඳහා මේ ලිපි පෙළින් හඳුන්වාදීමට අපේක්ෂිතය.

## කවියෙන් කියන වග



මිනිසා විසින් මිනිසකු අබිබවන  විනේ
බිහිසුනු ගතිය කාගෙත් හදවතට  දැනේ
ජාතික සමගියක විය යුතු මහගු  ගුනේ
මේ මනු පුතුන් මුලු ලොවටම කියනු  පෙනේ

**වෙත්තසිංහ**

House in 22P for Sale
Dehiwala Aththidiya

Right next to Arpico Supermarket !

Suitable for both residential and
commercial purposes.

Perfect location for a housing/apartment project.

AUD 350,000 or
exchange with a property in Australia would be considered

Mobile/Viber/WhatsApp +94 76 947 0 937
Mobile (Ausi) +61 435 019 777

**Alpha Academy 2017**
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application,
please text student name, Class and school to
0457908918**